**අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය - 2017**

------------------------------------------------------------------------------------

අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල (එස්එෆ්ඩී) අතර 2008 මාර්තු 26 දින එළඹි අංක 7/477 හා 2015 ඔක්තෝබර් 30 දින එළඹි අංක 11/640 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කොළඹ මහරෝහල් පරිශ්‍රයේ සම්පූර්ණ උපකරණ වලින් සමන්විත අපස්මාර රෝහලක් ඉදිකිරීම හා එක් එක් පළාත්වල, පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමයි. ණය ගිවිසුම අනුව, සෞදි රියල් මිලියන 75 කට සමාන රු. මිලියන 2,273 ක මුදලක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල මූලිකව එකඟවී තිබුණි. තවද 2015 ඔක්තෝබර් 30 දින අතිරේක ණය ගිවිසුමක් මගින් සෞදි රියල් මිලියන 45 කට සමාන රු. මිලියන 1,690.65 ක අතිරේක ණය මුදලක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 මාර්තු 26 දින ආරම්භ කරන ලද අතර 2009 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2017 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 05 කදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලක ක්‍රම තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලව විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදනම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැළසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම විගණනයට ඇතුලත්වේ. මගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලබන එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂාවට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිත ආයතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් හා කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙනයනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුනේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණය අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබූ බව,

(ඇ) මගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබූ බව, සහ

(ඈ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබූ බවත්ය.

### 2.2 ගණකාධිකරණ අඩුපාඩු

--------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත් කටයුතු අවසන් කර මහජනයාට විවෘත කර තිබුණද රු. මිලියන 2,872.28 වූ අපස්මාර රෝහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

## 03. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය සහ 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය වැනි මූල්‍යයනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛණ කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛණයෙන් වෙන්කළ මුදල | උපයෝජනය කළ මුදල | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | සෞදි රියල් මිලියන | රු. මිලියන | රු. මිලියන | සෞදි රියල් මිලියන | රු. මිලියන | සෞදි රියල් මිලියන | රු. මිලියන |
| සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල(SFD) | 120.00 | 3,963.65 | 150.00 | 12.38 | 504.61 | 99.17 | 3,959.65 |
| ශ්‍රී ලංකා රජය (GOSL) | 161.25 | 6,295.72 | 20.00 | - | 43.25 | - | 723.08 |
| එකතුව | 281.25 | 10,259.37 | 170.00 | 12.38 | 547.86 | 99.17 | 4,682.73 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සාමාන්‍ය ලක්ෂණයක් ලෙස, ව්‍යාපෘතිය වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදිත මුදල් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. ඉදිකිරීම් වැඩ වල හා වෛද්‍ය උපකරණ මිලදීගැනීමේ මන්දගාමී ප්‍රගතිය නිසා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් පසුගිය වර්ෂ 10 ක කාලය තුල රු.මිලියන 7,223.82 ක් වෙන්කර තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කර තිබුණේ රු.මිලියන 4,682.73 ක් පමණි.

(ආ) ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව කාලීනව ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර ණය මුදල් ලැබීම් අපේක්ෂිත කාර්යයන්ට ඵලදායී ලෙස උපයෝජනය කර ව්‍යාපෘතියේ ප්‍රතිලාභ උකහා ගැනීමට කටයුතු කර නොතිබුණි. පළමු ණය ගිවිසුමේ වසර 05 ක් වූ ණය ආපසු ගෙවීම් කාලය 2013 මාර්තු 26 දින නිමවිය. එහෙයින් ණය වාරික ලෙස එකතුව සෞදි රියල් මිලියන 16.88 කට සමාන රු. මිලියන 626.91 ක් හා ඒ සඳහා වූ පොළී එකතුව සෞදි රියල් මිලියන 3.93 කට සමාන රු. මිලියන 143.80 ක් 2017 දෙසැම්බර් 31 වන විට ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම සඳහා සෞදි රියල් මිලියන 45 කට සමාන රු. මිලියන 1,690.65 ක අමතර ණය මුදලක්

ව්‍යාපෘතිය විසින් ඉල්ලුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් තවදුරටත් කරණු ලැබේ.

(i) ණය ගිවිසුම ප්‍රකාරව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 969.80 ක් පමණක් වෙන්කර තිබුණද ඒ සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුව රු. මිලියන 1,884.82 කට පිරිනමා තිබුණි.

(ii) අපස්මාර රෝහල හා පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථානවල උපකරණ ප්‍රසම්පාදනය සඳහා ණය ගිවිසුමේ වෙන්කර තිබූ රු. මිලියන 1,075.90 ක මුදලින් රු. මිලියන 337.26 ක් ව්‍යාපෘතියේ අරමුණු වලට අදාල නොවන ශ්‍රී ලංකා ජාතික රෝහලේ ස්නායු ශලා ඒකකයට වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා උපයෝජනය කර තිබුණි. උපකරණ ප්‍රසම්පාදනය සඳහා වෙන්කරන ලද මුදලේ ඉතිරි කොටස ගොඩනැගිලි ඉදිකිරීම් වියදම් පියවා ගැනීම සඳහා උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, වෙන්කළ මුදල් වෙනත් කාර්යයන් වලට භාවිතාකිරීම සම්බන්ධයෙන් අදාළ ණය දෙන ආයතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වෛද්‍ය උපකරණ, ලිෆ්ට්, විදුලි ජනක යන්ත්‍රය, උපදේශක සේවා ප්‍රසම්පාදනය සඳහා සහ අතිරේක පිරිවැය දැරීම සඳහා රු.මිලියන 1,480 ක අතිරේක මුදල් අවශ්‍යතාවයක් ව්‍යාපෘතිය විසින් ඉල්ලුම් කර තිබුණි.

(iii) ඉහත සඳහන් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස මූලික අදියරේදී එකඟවූ රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ උපදේශන ගාස්තු සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වූ රු. මිලියන 164.05 ක මුදල රු. මිලියන 429.29 දක්වා වැඩිවී තිබුණි. තවද, සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ඉදිකිරීමේ උපදේශන ගාස්තු සඳහා වෙන්කර තිබූ මුදල් අතිරේක පිරිවැය දැරීම සඳහා උපයෝජනය කර තිබුණි.

(ඇ) ලද තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර ප්‍රමාණය රු. මිලියන 473.03 වූ අතර එයින් රු. මිලියන 240.10 ක් 2018 ජූලි 01 දින වන විටත් හිඟව පැවතුණි.

### 3.2 භෞතික කාර්යසාධනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලද තොරතුරු අනුව, 2014 අප්‍රේල් 03 දින නිම කිරීමට යෝජිතව තිබූ මහල් 08 කින් යුත් අපස්මාර රෝහල් ගොඩනැගිල්ල දින 950 ක ප්‍රමාදයකින් පසු 2016 නොවැම්බර් 09 දින නිමකර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත භාරදෙන ලදී. රෝහල මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණේ 2017 ඔක්තෝබර් 24 දිනදීය.

(ආ) මූලික ණය ගිවිසුම අනුව, පිරිවැය සෞදි රියල් මිලියන 161.25 කට සමාන රු. මිලියන 6,295.72 ක් වැයකර පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත්, බාහිර රෝගී සායන, රසායනාගාර සහ පුහුණු මධ්‍යස්ථාන ආදී කටයුතු වලින් සමන්විත සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 හි ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 31 දින වනවිටද ආරම්භකර නොතිබුණි. තවද, පළාත් 09 හි සෞඛ්‍ය මධ්‍යස්ථානවල වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සඳහා වියදම් කිරීමට එකඟවී තිබුණු සෞදි රියල් මිලියන 45 කට සමාන රු. මිලියන 1,690.65 ක අතිරේක ණය මුදල අපස්මාර රෝහල ඉදිකිරීම සඳහා මුළුමනින්ම වැයකර තිබුණි.

## 3.3 අවිධිමත් ගණුදෙනු

----------------------

ව්‍යාපෘතිය විසින් Magnetic Resonance Imaging Scanner (MRI), Single Proton Emission Computed Tomography Scanner (SPET), Positron Emission Tomography Scanner (PET) සහ Digital Subtraction Angiography System (DSA) ආදී රෝග නිරීක්ෂණ වෛද්‍ය ප්‍රතිරූපන උපකරණ (Diagnostic Medical Imaging Equipment) රු. මිලියන 732.77 ක පිරිවැයකට ජාත්‍යාන්තර තරඟකාරී මිල කැඳවීම් මඟින් මිලදීගෙන තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) Magnetic Resonance Imaging Scanner (MRI) හා Positron Emission Tomography Scanner (PET) යන්ත්‍රවල තෝරාගත් සැපයුම්කරු විසින් තාක්ෂණික පිරිවිතරවල ඇතුළත් තීරණාත්මක අවශ්‍යතාවයන් (critical requirements) ප්‍රකාරව මිල කැඳවන අවස්ථාවට වලංගු වූ එක්සත් ජනපදයේ ආහාර හා ඖෂධ සංවිධානය(U.S. FDA) විසින් නිකුත්කරනු ලබන නිෂ්කාෂණ සහතිකයක් ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) යන්ත්‍රවල මාදිළිය 2010 වර්ෂයට පසු ප්‍රථම වරට අඳුන්වා දුන් වර්ෂයක් වියයුතු වුවත්, තෝරාගත් සැපයුම්කරුවන් විසින් MRI, SPECT සහ PET පරිලෝකන යන්ත්‍ර සඳහා ඉදිරිපත් කර තිබූ මිල දැන්වීම් ලේඛන වල මාදිළි වර්ෂය සඳහන් කර නොතිබුණි. එහෙත්, අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවට සහයවීම සඳහා පත්කළ තාක්ෂණික ඇඟයීම් කමිටුව එම තීරණාත්මක අවශ්‍යතාවයන් නොසලකා අදාල ලංසු නිර්දේශ කර තිබුණි.

(ඇ) මිලගනන් කැඳවන අවස්ථාවේදී SPECT ස්කෑනර් යන්ත්‍රය සඳහා තාක්ෂණික පිරිවිතර සකස්කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, මිලකැඳවීම් අවසන් කරන අවස්ථාවේ වෙළඳපළට හඳුන්වාදී නොතිබුණු නවතම මාදිළියේ ස්කෑනර් යන්ත්‍රයක් සඳහා තෝරාගත් සැපයුම්කරු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. සැපයුම්කරුගේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර තිබුණු තොරතුරු මත පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම යන්ත්‍රය ඇගයීම් කර තිබුණි.

(ඈ) අවිච්ඡින්න විදුලි පද්ධතිය (Uninterrupted Power System) පිළිබඳ විස්තර ලංසු මුල් පිටපත්වල අත්‍යාවශ්‍ය අමතර කොටස් යටතේ සඳහන් කර නොතිබූ ලෙස සඳහන් කර රු. මිලියන 4.98 ක අමතර ගෙවීමක් යටතේ එම සැපයුම්කරුගෙන්ම PET සහ DSA යන්ත්‍ර සඳහා අවිච්ඡින්න විදුලි පද්ධති 02 ක් ව්‍යාපෘතිය විසින් මිලදීගෙන තිබුණි.

(ඉ) රෝග නිරීක්ෂණ වෛද්‍ය ප්‍රතිරූපන උපකරණ සැපයුම්කරුවන් විසින් රෝහලේ අදාල නිලධාරීන් සඳහා ලබාදීමට එකඟවී තිබුණු පරිශ්‍රය තුළ (Onsite) සහ විදේශ පුහුණුව 2018 අගෝස්තු 01 වන විටත් අවසන් කර නොතිබුණි.

(ඊ) PET පරිලෝකන යන්ත්‍රය සඳහා අවශ්‍ය “Radioactive Flideoxyglucose” නම් වූ අත්‍යාවශ්‍ය රසායන ද්‍රව්‍ය ආනයනය කිරීමේ ප්‍රමාදයත්, අත්‍යාවශ්‍ය අමතර කොටස් නොමැතිවීමත් නිසා MRI යන්ත්‍රය හැර අනෙකුත් සියළු වෛද්‍ය උපකරණ 2017 දෙසැම්බර් 31 දිනට මාස 06 කට අධික කාලයක් නිශ්කාර්යව පැවතුනි.

(උ) සැපයුම්කරුවන් සමඟ එකඟවී තිබුණු කොන්දේසි ප්‍රකාරව, රෝග නිරීක්ෂණ වෛද්‍ය ප්‍රතිරූපන උපකරණ සවිකළ දින සිට මාස 36 ක් වූ වගකීම් කාලයෙන් 2018 අගෝස්තු 31 දින වනවිට ඒවායේ ප්‍රතිරූපන ලබාගැනීමේ කටයුතු ආරම්භ කිරීමටත් පෙර මාස 24 කට ආසන්න කාලයක් ගෙවීගොස් තිබුණි.

(උ) 2017 පෙබරවාරි 03 දින සිට යන්ත්‍රය අඛණ්ඩව ක්‍රියාත්මක නොකිරීම නිසා MRI පරිලෝකන යන්ත්‍රයේ "Cold Head" ප්‍රදේශයේ චුම්බකත්වය රඳවාගැනීම සඳහා අවශ්‍ය ද්‍රව හීලියම් එහි අවදානම් මට්ටම දක්වා පහත වැටී තිබුණු බව නිරීක්ෂණය විය. තාක්ෂණික පිරිවිතර කොන්දේසි අංක 15 හා කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 25.3 දරන උපවගන්තියට පටහැනිව සැපයුම්කරුගේ ගාස්තු රහිත නඩත්තු කාලය නොසළකා ද්‍රව හීලියම් පිරවීමට රෝහල විසින් රු.895,000 ක් වැය කර තිබුණි.

### 3.4 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය රෙගුලාසි 133(1) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යාපෘති කටයුතු පිළිබඳ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 756 හි විධිවිධාන පරිදි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ රු. මිලියන 1,635 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

(ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක. අයිඒඅයි/2002/02 චක්‍රලේඛ යෙන් අවශ්‍ය පරිදි ව්‍යාපෘතිය රු.824,096 ක් වටිනා පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ හේතුකොට ගෙන ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම් භාරදීම විධිමත් ආකාරයෙන් සිදුකළ නොහැකි වනු ඇත.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2016 මාර්තු 24 දිනැති අංක. 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව, වැඩබලන පදනමින් රාජකාරි ආවරණය කරන ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සේවා කාලය, ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය සහ අධිපිරිවැය නොසලකා අඛණ්ඩව දීර්ඝ කර තිබුණි.